සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2019 ජනවාරි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2019-02-02
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ* ***නොහැකි*** *ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න පහළොව (15) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.8 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) කළමනාකරණ ගිණුම්කරණය මගින් බාහිර ඇල්මැති පාර්ශවයන්ට (stakeholders) පමණක් තොරතුරු සපයයි.

(2) මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ වංචා සහ වැරදි වැළැක්වීමයි.

(3) ගනුදෙනු යනු ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුම වේ.

(4) අදාළ බව යනු මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයකි. (ලකුණු 02)

**1.2** අස්තිත්වයක් විසින් අනුගමනය කරනු ලබන ක්ෂය ක්‍රමය පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වසරින් වසර වෙනස් නොකළ යුතු වේ. මෙසේ සැළකීමට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පයයි.

(2) අස්තිත්ව (Entity) සංකල්පයයි.

(3) සංගතතා (Consistency) සංකල්පයයි.

(4) උපලබ්ධි (Realization) සංකල්පයයි. (ලකුණු 02)

1.3 හරපතක් යනු:

(1) සමහර හේතු නිසාවෙන්, ආපසු එවූ භාණ්ඩවල වටිනාකම අඩුකරමින්, ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත නිකුත්කරනු ලබන ලියවිල්ලකි.

(2) පෙර ඉන්වොයිසියක කොන්දේසි යටතේ ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත ගෙවිය යුතු වටිනාකම අඩුකරමින් විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත නිකුත්කරනු ලබන ලියවිල්ලකි.

(3) පාර්ශවයන් දෙකක් අතර සිදුවූ මූල්‍යමය ගනුදෙනුවකට සාක්ෂියක් වශයෙන් භාවිත කළ හැකි ලියවිල්ලකි.

(4) අස්තිත්වයට මුදල් ලැබුණු බව ඔප්පු කිරීමට, ව්‍යාපාරයේ වගකිවයුතු තැනැත්තෙකු විසින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි. (ලකුණු 02)

1.4 ණයහිමියෙකුට මුදලින් පියවීම නිසා ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම.
(2) වත්කම් අඩුවීම සහ වගකීම් වැඩිවීම.
(3) වගකීම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම.
(4) වගකීම් අඩුවීම සහ ස්කන්ධය වැඩිවීම.

(ලකුණු 02)

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, "ආදායම් ප්‍රකාශනයේ" මූලිකාංග අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) වත්කම් සහ වගකීම්.
(2) වගකීම් සහ ආදායම්.
(3) වියදම් සහ ස්කන්ධය.
(4) ආදායම් සහ වියදම්. (ලකුණු 02)

1.6 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු, **මූන් ලංකා ට්‍රේඩර්ස්** හි පොත්වලින් උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 750,000 |
| වර්ෂය තුළදී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය | 50,000 |
| 2018 මාර්තු 31 දිනට වගකීම් | 75,000 |
| 2018 මාර්තු 31 දිනට මුළු වත්කම් | 987,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වන්නේ:

(1) රු.112,000/-. (2) රු.237,000/-. (3) රු.187,000/-. (4) රු.162,000/-.

(ලකුණු 02)

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක ඇති ප්‍රධාන ගොනුවක් (master file) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) තොග ප්‍රධාන ගොනුව.
(2) වැටුප් (Payroll) ප්‍රධාන ගොනුව.
(3) ණයගැති ප්‍රධාන ගොනුව.
(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.8** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ABC ට්‍රේඩර්ස්** හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

| | රු. |
|---|---|
| විකුණුම් | 750,000 |
| ගැනුම් | 425,000 |
| 2018 මාර්තු 31 දිනට තොගය | 250,000 |
| දළ ලාභය | 187,500 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2017 අප්‍රේල් 01 දිනට පැවති තොගයේ වටිනාකම වනුයේ:

(1) රු.112,500/-. (2) රු.387,500/-. (3) රු.575,000/-. (4) රු.262,500/-.
(ලකුණු 02)

*අංක **1.9** සිට **1.15** දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.9** මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.
(ලකුණු 02)

**1.10** විකුණුම් ඉන්වොයිසියක ඇතුලත් වැදගත් කරුණු තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.11** පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක, තාවකාලික (temporary) ගොනු තිබීමේ අරමුණ කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 03)

**1.12** පහත සඳහන් එක් එක් ගනුදෙනු සඳහා අදාලවන ගිණුම්කරණ සංකල්පය හඳුනා දක්වන්න:

(a) නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදී දරණ ලද වියදම්, සත්‍ය වශයෙන් ගෙවීම් කළේද යන්න නොසළකා සැළකිල්ලට ගත යුතුය.

(b) ව්‍යාපාරයේ ඉඩමක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගැනුම් මිලට (purchase price) පෙන්නුම් කරයි.

(c) ණයගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනයක් සිදුකළ යුතුයි. (ලකුණු 03)

**1.13** **සමන්තා ට්‍රේඩර්ස්,** 2016 අප්‍රේල් 01 දින රු.900,000/- කට යන්ත්‍රයක් මිලට ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, වාර්ෂිකව 25% බැගින් වූ අනුපාතයකට හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.

2018 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය (ශුද්ධ පොත් අගය) ගණනය කරන්න. (ලකුණු 03)

**1.14** පහත සඳහන් එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න. උත්තරය (සත්‍ය හෝ අසත්‍ය), යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

(a) පොදු ලෙජරය යනු මූලික පොතකි.

(b) ව්‍යාපාරයේ වියදම් සහ ආදායම් ගිණුම්, නාමික ගිණුම්වල ඇතුලත් වේ.

(c) කාර්යාලයේ භාවිතය සඳහා ණය පදනම මත රු.100,000/- කට පරිගණකයක් මිලට ගැනීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම්වලට පමණක් බලපායි.

(d) ගනුදෙනුවක් ගිණුම් පොත්වලින් සම්පූර්ණයෙන්ම අත්හැරී තිබේ නම්, එය ශේෂ පිරික්සුමේ තුලනයට බලපානු ලැබේ. (ලකුණු 04)

**1.15** **රසීන්,** තේවලස්වාමි ව්‍යාපාරයක් වන **රසීන් ට්‍රේඩර්ස්** හි අයිතිකරු වේ. **රසීන් ට්‍රේඩර්ස්** හි පහත දැක්වෙන එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න.

(a) නැවත විකිණීම සඳහා රු.95,500/- ක භාණ්ඩ, මුදලට මිලදී ගැනීම.

(b) **රසීන්,** ඔහුගේ පුතාගේ අමතර පංති ගාස්තු වන රු.24,000/- ව්‍යාපාරයේ මුදලින් ගෙවීය.

(c) **රසීන්,** රු.1,000,000/- ක් වටිනා ඔහුගේ පුද්ගලික ඉඩම අමතර ප්‍රාග්ධනයක් ලෙස ව්‍යාපාරයට පවරා දුන්නේය.
(ලකුණු 06)
(මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**රණසිංහ,** 2017 අප්‍රේල් 01 දින මුදලින් රු.750,000/-ක් ආයෝජනය කරමින් **රණසිංහ ට්‍රේඩර්ස්** නම් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ලැබීම් ජර්නලයේ සහ මුදල් ගෙවීම් ජර්නලයේ සාරාංශය පහත පරිදි වේ:

| **මුදල් ලැබීම් ජර්නලය (ලැබීම්)** | **රු.** |
|---|---|
| **රණසිංහ** යෙදවූ ප්‍රාග්ධනය | 750,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,200,000 |
| අත්පිට මුදලට විකුණුම් | 625,000 |
| | **2,575,000** |

| **මුදල් ගෙවීම් ජර්නලය (ගෙවීම්)** | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,575,000 |
| වැටුප් සහ වේතන | 225,000 |
| විදුලි බිල්පත් | 89,000 |
| ගෘහ භාණ්ඩ මිලට ගැනීම | 75,000 |
| ජල බිල්පත් | 23,000 |
| සුළු මුදල් අග්‍රිමය | 25,000 |
| ගැනිලි | 100,000 |
| | **2,112,000** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 78,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 125,000 |
| උපචිත විදුලිය | 12,500 |

(2) සුළු මුදල් ගනුදෙනු පහත පරිදි විය:

**සුළු මුදල් පාලන ගිණුම**

| | **රු.** | | **රු.** |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුම | 25,000 | අනියම් වේතන | 5,800 |
| | | ගමන් වියදම් | 3,500 |
| | | ප / ගෙ ශේෂය | 15,700 |
| | **25,000** | | **25,000** |

(3) සියලුම ගැනුම් ණය පදනම මත සිදු කරනු ලබන අතර, 2018 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

(4) 2017 ඔක්තෝම්බර් 01 දින රු.75,000/- කට ගෘහ භාණ්ඩ අත්පත් කරගන්නා ලද අතර, ඒවා පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනට **රණසිංහ ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු, පාසැල් බෑග් නිෂ්පාදකයෙකු වන **සීමාසහිත කෝඩ් ලංකා සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අදාල වේ:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය මිලට ගැනීම | 2,100,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 675,000 |
| කම්හල් යන්ත්‍රෝපකරණ මත අළුත්වැඩියා සහ නඩත්තු | 175,000 |
| ඉන්ධන වියදම් | 120,000 |
| ගෙන ඒමේ කුලී - අමුද්‍රව්‍ය | 110,000 |
| විදුලිය වියදම් | 200,000 |
| ගොඩනැගිලි කුලී | 600,000 |
| කම්හලේ ආරක්ෂක වියදම් | 135,000 |
| කම්හල් යන්ත්‍ර - පිරිවැයට<br>(2017 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලද) | 1,000,000 |
| සෘජු වේතන - නිෂ්පාදන කම්කරුවන් | 720,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග, පහත පරිදි ගණනය කර ඇත:

| | 2017 අප්‍රේල් 01 දිනට | 2018 මාර්තු 31 දිනට |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 3,400,000 | 2,000,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 1,600,000 | 985,000 |

(2) කම්හල් යන්ත්‍ර, පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කිරීම **සීමාසහිත කෝඩ් ලංකා සමාගමේ** ප්‍රතිපත්තිය වේ.

(3) ගොඩනැගිලි කුලිය, ඉන්ධන වියදම් සහ විදුලිය වියදම් පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

කර්මාන්ත ශාලාව - 75%

කාර්යාලය - 25%

(4) නිෂ්පාදනය කරන ලද පාසැල් බෑග්, පිරිවැය මත 10% ලාභාන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත කෝඩ් ලංකා සමාගමේ** නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**හුසේන් ට්‍රේඩර්ස්** හි ගිණුම් සහායක විසින් 2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර වෙනස වූ රු.32,500/-, අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදි.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනාගන්නා ලදි:

(1) 2018 මාර්තු මාසය සඳහා වූ රු.78,000/- ක ආරක්ෂක වියදම් ගෙවීම, ආරක්ෂක වියදම් ගිණුමේ රු.7,800/- ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ නමුත් මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(2) වෙළෙඳ ණයගැතියෙකුගෙන් ලැබුණු රු.225,000/- ක්, වෙළෙඳ ණයගැති ගිණුමේ රු.22,500/- ක් ලෙස සටහන් කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(3) රු.75,000/- ක යන්ත්‍ර නඩත්තු කිරීමේ වියදම්, යන්ත්‍ර ගිණුමේ සටහන් කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(4) රු.55,000/- ක, උපචිත දුරකතන වියදම්, සම්පූර්ණයෙන්ම පොත්වලින් මගහැරී තිබුණි.

(5) රු.114,800/- ක අත්පිට විකුණුම්, මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණද, විකුණුම් ගිණුමේ දෙවරක් සටහන් කර තිබුණි.

(6) රු.25,000/- ක කුලී වියදම්, කුලී ආදායම් ගිණුමට බැර කර තිබුණි. කෙසේ නමුත් මුදල් පොතේ එය නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) පහත සඳහන් ගනුදෙනු 2018 මාර්තු මාසය සඳහා **රියල් ඉලෙක්ට්‍රිකල්ස්** හි ණයට විකුණුම්වලට අදාල වේ:

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | අයිතම විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල | වෙළෙඳ වට්ටම |
| 2018.03.02 | 256 | **ග්‍රීන් ට්‍රේඩර්ස්** | විදුලි පුවරු | 75 | 115 | - |
| 2018.03.15 | 257 | **නිහාල් මහතා** | විදුලි බල්බ | 100 | 230 | 10% |
| 2018.03.30 | 258 | **චන්දන ස්ටෝර්ස්** | විදුලි පුවරු | 110 | 115 | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු මාසය සඳහා **රියල් ඉලෙක්ට්‍රිකල්ස්** හි විකුණුම් ජර්නලය (දෛනික විකුණුම් පොත) **පිළියෙල කරන්න**.

(ලකුණු 04)

(B) **විජේසූරිය,** 2018 සැප්තැම්බර් 01 දින කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය. පහත සඳහන් ගනුදෙනු 2018 සැප්තැම්බර් මාසය සඳහා ඔහුගේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2018.09.01 | මුදලින් රු.800,000/- ක් ආයෝජනය කරමින් **විජේසූරිය** ව්‍යාපාරය ආරම්භ කළේය. තවද, ඔහු රු.1,500,000/- ක් වටිනා ඔහුගේ පෞද්ගලික වෑන් රථය ව්‍යාපාරයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආයෝජනය කළේය. |
| 2018.09.05 | නැවත විකිණීම සඳහා රු.625,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිළදී ගත්තේය. |
| 2018.09.18 | රු.375,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු.485,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2018.09.26 | රු.125,000/- ක සේවක වැටුප් ගෙවන ලදී. |
| 2018.09.28 | **විජේසූරිය** විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා රු.35,000/- ක මුදලක් ව්‍යාපාරයෙන් ලබාගන්නා ලදී. |
| 2018.09.30 | ණයට ලබාගත් භාණ්ඩ වෙනුවෙන් ණයහිමියන්ට රු.125,000/- ක් ගෙවන ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්] (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**සම්පත් ට්‍රේඩර්ස්,** යනු **සම්පත්ට** අයත් තනිවාසි ව්‍යාපාරයකි. 2018 මාර්තු 31 දිනට **සම්පත් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**සම්පත් ට්‍රේඩර්ස්**

**2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---:|---:|
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට: | | |
| ඉඩම | 6,000 | |
| ගොඩනැගිලි | 4,500 | |
| පරිගණක | 500 | |
| කාර්යාල උපකරණ | 1,200 | |
| 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 2,400 |
| පරිගණක | | 140 |
| කාර්යාල උපකරණ | | 390 |
| විකුණුම් | | 19,500 |
| ගැනුම් | 8,850 | |
| 2017 අප්‍රේල් 01 දිනට තොග | 1,900 | |
| පොලී ආදායම | | 200 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 5,850 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,200 |
| ප්‍රදර්ශනාගාරය සඳහා ගෙවූ කුලී | 1,890 | |
| විදුලිය | 990 | |
| ජලය | 145 | |
| වැටුප් සහ වේතන | 1,650 | |
| බැංකු අයිරාව | | 2,100 |
| විකුණුම් කොමිස් | 450 | |
| බැංකු අයිරා පොලිය | 275 | |
| 2017 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා වෙන්කිරීම | | 560 |
| ගැනිලි | 250 | |
| ස්ථාවර තැන්පතු (මාස 03) | 6,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 11,960 |
| | **40,450** | **40,450** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට පැවති අවසාන තොගය, පිරිවැයට, රු.2,100,000/- කට අගය කරන ලදී.

(2) දේපළ, පිරියත සහ උපකරණ සඳහා පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | 10% |
| පරිගණක | : | 25% |
| කාර්යාල උපකරණ | : | 20 % |

(3) 2018 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය වූ රු.75,000/-, 2018 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(4) වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් රු.40,000/- ක් ලියා හැරීමටත් 2018 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක අඩමාණ ණය සඳහා පොදු ප්‍රතිපාදනයක් කිරීමටත් කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී.

(5) 2017 අප්‍රේල් 01 දින, ප්‍රදර්ශනාගාරය සඳහා අවුරුද්දක කාලයක් වෙනුවෙන් කුලී ගිවිසුමකට එළඹ ඇත. ප්‍රදර්ශනාගාරයේ මාසික කුලිය රු.189,000/- කි.

(6) ස්ථාවර තැන්පතු (මාස 03) මත පොලිය නිවැරදිව පොලී ආදායම් ගිණුමේ සටහන් කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |